ආයතනයේ නම : ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

**நிறுவனத்தின் பெயர் : போக்குவரத்து மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சு**

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்

**Name of the institution: Ministry of Transport & Highways**

**Submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No.119(4)**

ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය
போக்குவரத்து மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சு
MINISTRY OF TRANSPORT & HIGHWAYS

මගේ අංකය / எனது இல. / My No. MOH/ACC/13/2023/01 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2022.02.15

ලේකම්,
සභානායක කාර්යාලය,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර,
කෝට්ටේ.

**රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධව නිරීක්ෂණ හා ගනු ලබන පියවරයන් ඉදිරිපත් කිරීම**

උක්ත කරුණ සම්බන්ධයෙන් පාර්ලිමේන්තු ලේකම් ජනරාල් විසින් මා වෙත එවන ලද **2022.12.13** දිනැති ලිපිය හා බැඳේ.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක **183** හි රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ දෙවැනි වාර්තාවේ මහාමාර්ග අමාත්‍යාංශය සම්බන්ධයෙන් දක්වා ඇති කරුණු පිළිබඳ මාගේ නිරීක්ෂණයන් හා නිවැරදි කිරීම සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ භාෂාත්‍රයෙන්ම පිටපත් **12**ක් සංයුක්ත තැටි **02**ක් මේ සමඟ ඉදිරිපත් කරමි.

ආචාර්ය බන්දුල ගුණවර්ධන
ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍ය

ආචාර්ය බන්දුල ගුණවර්ධන
ප්‍රවාහන, මහාමාර්ග හා ජනමාධ්‍ය අමාත්‍ය

පිටපත - ලේකම්, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව - භාෂාත්‍රයෙන්ම පිටපත බැගින් අවශ්‍ය කටයුතු සඳහා.

"මගනැගුම මහමැඳුර" (08 වන මහල), ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල.
'மகநெகும மஹமெதுர' (08 வது மாடி), டென்சில் கொப்பேகடுவ மாவத்தை, கொஸ்வத்தை, பத்தரமுல்ல.
"Maganeguma Mahamedura" (08th Floor), Denzil Kobbekaduwa Mawatha, Koswatta, Battaramulla.
Tel. : +94 (0) 11 2050522 / 2887677 Fax : +94 (0) 11 2863296 Web Site : www.mohsl.gov.lk

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධව නිරීක්ෂණ හා ගනු ලබන පියවරයන් ඉදිරිපත් කිරීම.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක - 183

ආයතනයේ නම - මහාමාර්ග අමාත්‍යාංශය

පළමු කොටස

| අනු අංකය | මූලා හා කාර්යසාධනය ඇගයීම පිළිබඳ හඳුනාගත් අඩුලුහුඩුකම් - මූලා වර්ෂ 2019 | අඩුලුහුඩුකම් නිවැරදි කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ග / වර්තමාන තත්ත්වය |
|---|---|---|
| 01 | අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුල පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි | 2020 වර්ෂයේ පැවති කොවිඩ් අවදානම් තත්ත්වයේ වුවද, 2020 අභ්‍යන්තර විගණන සැලසුම පරිදි මෙම වර්ෂය තුළ දී අභ්‍යන්තර විගණන වාර්තා 12ක් සහ ලේකම්තුමා විසින් පවරන ලද විශේෂ විමර්ශන 16ක් නිකුත් කරන ලදී. මෙම විගණන වාර්තාවලින් 07ක් සඳහා පිළිතුරු මසක් තුළ ඉදිරිපත් විය. කෙසේ වුව ද, වාර්තා 04 ක් සඳහා මසක් ඉකුත් වී ඊළඟ මාසය ගතවීමට පෙර පිළිතුරු ලැබී ඇති අතර එක් වාර්තාවක් සඳහා පමණක් පිළිතුරු ලැබී ඇත්තේ මාස කිහිපයක් ගතවීමෙන් අනතුරුව බව කාරුණිකව දන්වා සිටිමි. එසේම රට තුළ පැවති පාලනය කල නොහැකි සෞඛ්‍යමය අවදානම් තත්ත්වය මත මෙසේ සිදු වූ බව අදහස් කරමි. |
| 02 | විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර 2ක් වත් පවත්වා නොතිබුණි. | ලොව පුරා ව්‍යාප්ත වූ දැඩි කොවිඩ් අවදානම් තත්ත්වය යටතේ රට බොහෝ කාලයක් වසා තැබීම, අත්‍යාවශ්‍ය සේවා පමණක් ඉටු කිරීම, නිලධාරින් කැඳවීම හා රැස්වීම් පැවැත්වීම අත්හිටුවීම වැනි කරුණු හේතුවෙන් මෙම රැස්වීම් පැවැත්වීම ද සිදු නොකළ අතර 2020.01.24 දිනැතිව වර්ෂය තුළ එක් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමක් පවත්වන ලදී. එමෙන්ම 2020 වර්ෂයේ අවසන් කාර්තුවට අදාළව 2021.02.01 දින විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමක් පවත්වන ලද බව කාරුණිකව දන්වා සිටිමි.<br><br>තව ද, කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව මගින් නිකුත් කල අංක DMA/AMC/M/2020/5-4 හා 2020.06.02 දිනැති ලිපිය මගින් 2020 වර්ෂයේ දී කාර්තුවකට එක බැගින් වර්ෂයකට විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04ක් පැවැත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කර ඇති බව ද වැඩිදුරටත් දන්වා සිටිමි. |
| 03 | වාහනයක් ගර්හිත වී මාස 6කට වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි | අමාත්‍යාංශය සතු වූ ධාවන තත්වයේ නොපැවති හා නඩත්තු කිරීම ආර්ථික වශයෙන් ඵලදායී නොවන වාහන අපහරණය සඳහා හඳුනාගෙන තිබුණද පැවති කොවිඩ් වසංගත තත්වය නිසා ගර්හිත වී මාස 06 ක් තුළදී අපහරණය කිරීමට නොහැකිව ඇත. ඊට අමතරව අපහරණය සඳහා හඳුනාගත් වාහන නැවත ධාවන තත්වයට පත් කිරීමට තීරණයක් ගෙන තිබුනේ වාහන ආනයනය නවතා ඇති පසුබිමකය. නමුත් වත්මනෙහි වියදම් සීමා කිරීම සඳහා ගන්නා ලැබූ ප්‍රතිපත්තිමය තීරණ නිසා එකී වාහන ධාවන තත්වයට පත් කිරීම ආර්ථික වශයෙන් ඵලදායී නොවන බැවින් එම අලුත්වැඩියාවන් නවතා දමන ලද අතර, එකී ධාවන තත්වයේ නොපවතින වාහන හඳුනාගෙන නැවතත් අපහරණ ක්‍රියාවලිය ආරම්භ කර ඇත. |
| 04 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව | 2020 වර්ෂයේ ඉන්ධන දහන පරීක්ෂාවක් සිදු කිරීමට මාර්තු මාසයේ උත්සාහ කර තිබුණද පැවති කොවිඩ් වසංගත තත්වය හමුවේ එම ක්‍රියාවලිය සුමටව කිරීමට නොහැකි වී ඇත. ඊට අමතරව වත්මනෙහි පවතින ඉන්ධන සැපයුම් සීමා සහිත වීම මත දහන පරීක්ෂාවක් සිදු කිරීමට නොහැකි වී ඇත. |

| | | |
|---|---|---|
| | ආයතනය සතු වාහනවල ඉන්න දහනය වීම පිළිබඳ පරීක්ෂාවන් කර නොතිබුණි | |
| 05 | මු.රෙ.94(1) ප්‍රකාරව වැය විෂයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කල පසු ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව අනුමත සීමාවන් ඉක්මවා බැඳීම් ඇති කර ගෙන තිබුණි. | මාර්ග ඉදි කිරීම වැනි අතිවිශාල ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබන්නේ විදේශ ණය ආධාර යටතේ වන අතර එම ණය ගිවිසුම අනුව සහ ඉදිකිරීම්වල සංකීර්ණතාවය අනුව මාර්ග ඉදිකිරීම් කාර්යයන් අවසන් කිරීම සඳහා වසර කිහිපයක් ගතවේ. මේ අනුව එක් එක් වර්ෂයන් සඳහා පුරෝකතනය කරනු ලබන මුදල් ප්‍රවාහයන් අනුව අය වැය වර්ෂයන් සඳහා ප්‍රතිපාදන ඉල්ලුම් කරනු ලබයි. කෙසේ වුවද බොහෝ අවස්ථාවල එසේ පුරෝකතනය කරනු ලැබූ සම්පූර්ණ මුදල් ප්‍රමාණය සඳහා වාර්ෂික ඇස්තමේන්තුවේ ප්‍රතිපාදන ප්‍රමාණවත්ව නොලැබෙන අතර පසු අවස්ථාවල අතිරේක ප්‍රතිපාදන ලබා ගැනීම හා පරිපූරක ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම මගින් අදාල අනුමත ප්‍රතිපාදන සීමාවන් වැඩි කර ගනු ලබයි. විදේශ ණය ලබා ක්‍රියාත්මක කරණු ලබන ව්‍යාපෘතියක කොන්ත්‍රාත්කරු වැඩ ආරම්භ කල පසුව ප්‍රතිපාදන සීමා මත වැඩ නැවැත්වීමට සිදු වුවහොත් අදාල ගිවිසුම් අනුව අධික පොදු කාර්ය පිරිවැයක් ( **Prolongation cost**) ගෙවීමට සිදු වන අතර සිදු කරනු ලැබූ කාර්ය සඳහා ගෙවීම් ප්‍රමාද වුවහොත් අධික පොළියක් හා ප්‍රමාද ගාස්තු ප්‍රමාණයක් ගෙවීමට සිදු වේ.<br>මීට අතිරේක වශයෙන් ඉඩම් අත්පත් කර ගැනීම සඳහා වන්දි ගෙවීම් ප්‍රමාද වීම සිදුවීම, මන්දගාමීව ඉදිකිරීම් සිදු වීම ආදී කරුණු මත සමාජ උද්සෝෂණද ඇති විය හැක. මෙවැනි අවස්ථාවලදී ගෙවීම් අදියර වන විට අවශ්‍ය ප්‍රතිපාදන සලසා ගැනීමට යටත්ව බැඳීම් ඇති කර ගනු ලබන අවස්ථා ඇති බව දන්වමි. කෙසේ වෙතත් වාර්ෂික ඇස්තමේන්තු කෙටුම්පත් මගින් ඉල්ලුම් කරනු ලබන ප්‍රතිපාදන ප්‍රමාණවත්මකව නොලැබෙන අවස්ථාවලදී මෙවැනි තත්ත්වයන්ට මුහුණ දීමට සිදු වන අතර මෙවැනි තත්වයන් අවම කර ගැනීමට අදාල නිළධාරින්ට අවශ්‍ය උපදෙස් ලබා දී ඇත. |
| 06 | වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි. | • ඒ.ආර්.කරුණාරත්න මයා - රු.37,774.00<br>• පී.එම්.චන්ද්‍රසිරි මයා - රු.24,481.00<br>• එල්.ඩබ්.විමලසිරි මයා - රු 72,392.00<br>වසර ගණනාවක සිට අය වීමට ඇති ණය ශේෂ ලෙස පොත්වල පැවතගෙන එන ඉහත සඳහන් ණය ශේෂ නිරාකරණය කර ගැනීම සඳහා විවිධ ක්‍රියාමාර්ග රාශියක් ගෙන ඇති නමුත් මේ දක්වා ඒ සම්බන්ධයෙන් කිසිදු සාර්ථකත්වයක් ලබා ගැනීමට නොහැකි විය.<br>• ඩී.පී.දහනායක මයා - රු.157,675.00<br>පසුගිය ගොනු පරිශීලනය කිරීමේදී ලබා ගත් පවත්නා තොරතුරු අනුව ඩී.පී.දහනායක මහතාගේ ණය ශේෂය ඒකපාර්ශ්විකව ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය තුල පමණක් පවත්නා බව පෙනී යන හෙයින් ඒ බව මුදල් අමාත්‍යාංශය වෙත දන්වා ණය ශේෂය කපා හැරීමට ඉල්ලීමක් කලද ඒ සඳහා අනුමැතිය නොලැබුණි. ඩී.පී.දහනායක මහතා ස්ථාන මාරු වී ඇති පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයෙන් එවකට ඔහුගේ ණය ශේෂය නිරවුල් කිරීම සඳහා ප්‍රවාහන හා මහමාර්ග අමාත්‍යාංශ වෙත එවා ඇති චෙක්පතෙහි නිශ්කාෂන තොරතුරු ලංකා බැංකුව බත්තරමුල්ල වෙතින් ඉල්ලා සිටිය ද ඒවා ලබා දීමට ලංකා බැංකුව සතු ව ප්‍රමාණවත් තොරතුරු නොපවතින බව දන්වා එවා ඇත. එබැවින් මෙම ණය ශේෂය පොත්වලින් ඉවත් කර ගැනීමට නොහැකි වීම මත හිඟ හිටි ණය ශේෂයක් ලෙස පොත්වල පවත්වාගෙන ඒමට සිදුව ඇත.<br>අදාල ලිපි ඇමුණුම 01,02,02(1) සහ 03,04,05 ලෙස ඉදිරිපත් කරමි. |

| | | |
|---|---|---|
| | | • එල්. ඩබ්.විමලවීර මයා<br><br>එල්. ඩබ්.විමලවීර මහතාගේ ණය ශේෂය දැනට අවුරුදු 32 ක් තරම් පැරණි වේ. මෙම නිලධාරියා ස්ථාන මාරු වී ඇති බව පෙනී යන මධ්‍යම පළාත් සභාව වෙතින් කිප වරකදී විමසීම් කර ඇත. පිළිතුරු වශයෙන් මධ්‍යම පළාත් සභාවේ ණය ලෙජර තුළ නිරවුල් වීම සඳහා එවන් වටිනාකමකින් යුත් ණය ශේෂයක් නොපෙන්වන බව ඔවුන් විසින් දන්වා එවා ඇත.<br>අදාල ලිපි ඇමුණුම 06,07,08 ලෙස ඉදිරිපත් කර ඇත.<br>• ඒ.ආර්.කරුණාරත්න<br>• පී.එම්.චන්ද්‍රසිරි<br>• එල්.ඩබ්.විමලසිරි<br><br>මෙම නිලධාරින් තිදෙනාගේම ණ ශේෂයන් අවුරුදු 30 කට වඩා පැරණි ණය ශේෂයන් වේ. ස්ථාන මාරු වූ සේවා ස්ථානයක් නිශ්චිතවම සොයා ගැනීමට නොහැකි වීම මත මෙම ණය ශේෂයන් නිරවුල් කර ගත නොහැකි වී තිබේ. විශ්‍රාම වැටුප් දෙපාර්තමෙන්තුව, ජාතික රක්ෂණ භාර අමුදල, රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය යන ආයතන වෙතින් ද වාර කිපයකදී විමසීම් කල ද නිශ්චිත තොරතුරක් සොයා ගැනීමට නොහැකි වීම මත ණය ශේෂ නිරවුල් කිරීමට නොහැකි විය.<br><br>අදාල ලිපි ඇමුණුම 09,10,11 ලෙස ඉදිරිපත් කර ඇත.<br>ඉහත නිලධාරීන් තිදෙනා පිළිබඳව කිසිදු ආකාරයක තොරතුරක් සොයා ගැනීමට නොහැකි වීම මත ඔවුන් මේ වන විට විශ්‍රාම වැටුප් ලබන වයසේ පසු වන බවට උපකල්පනය කොට ලංකාවේ සියලු ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙතින විමසීමට සිතා පළමු පියවර ලෙස මධ්‍යම පළාතේ සියලු ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා බස්නාහිර පළාතේ සියලු ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙතින් විමසීම් කර ලිපි තැපැල් කිරීම සිදු කර ඇත. මෙම නිලධාරීන්ගේ හැඳුනුම්පත් අංකයන් නොමැති වීම මත අදාල තොරතුරු ලබා දීමට හැකියාවක් නොමැති බව ප්‍රාදේශීය ලේකම් කාර්යාල කිහිපයකින්ම දැනුම් දී ඇත.<br>අදාල ලිපි ඇමුණුම 12 සහ 13 ලෙස ඉදිරිපත් කර ඇත.<br>නමුත් මෙම ක්‍රියාමාර්ග කිසිවකින් ණය ශේෂ නිරවුල් කිරීමට ප්‍රයෝජනයට ගත හැකි තොරතුරක් ලබා ගැනීමට නොහැකි විය. මෙම ශේෂයන් දිගින් දිගටම පොත්වල පවත්වා ගෙන ඒමට සිදුව ඇත්තේ නිරවුල් කිරීමේ ක්‍රියාමාර්ග දිගින් දිගටම ව්‍යවර්ථ වූ නිසාය. |
| 07 | සමාලෝචිත වර්ෂය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කල යුතු කාර්ය සාධන වාර්තා නියමිත දිනට ඉදිරිපත් කර නොතිබුණි | 2020 වර්ෂයේ වාර්ෂික කාර්යසාධන වාර්තාවෙහි කෙටුම්පත් වාර්තාව අංක MPH/HWY/PLM/Do.1/3/Vil.VIII හා 2021.02.25 දිනැති ලිපිය මගින් ජාතික විගණන කාර්යාලය වෙත ඉදිරිපත් කර ඇත. ඊට අදාල විගණකාධිපති වාර්තාව අංක ආර්සීඑ/ඒ/එම්ඕඑච්/එෆ්/2020/05 හා 2021.06.25 දිනැති ලිපිය මගින් අප වෙත ලැබී ඇත. ඒ අනුව, 2021.08.16 වැනි දින උක්ත වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා වන ලිපිය අත්සන් කර ඇතත් ඒ වන විට රට තුළ පැවැති කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් රට වසා දැමීමට සිදුවීම නිසා වාර්ෂික කාර්ය සාධන වාර්තාව 2020 පාර්ලිමේන්තුව වෙත භාර දෙන ලද්දේ 2021.10.11 දිනය. |

දෙවන කොටස

| අනු අංකය | මූලා හා කාර්යසාධනය ඇගයීම පිළිබඳ හඳුනාගත් අඩුලුහුඩුකම් - මූලා වර්ෂ 2019 | අඩුලුහුඩුකම් නිවැරදි කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ග / වර්තමාන තත්ත්වය |
|---|---|---|
| 01 | රාජ්‍ය පරිපාලන විධිවිධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | 2021 වර්ෂයේ සිට විධිමත් මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර ඒ අනුව කටයුතු කරමින් පවතී. |
| 02 | සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මගින් එක් සේවකයෙකු සඳහා අවම වශයෙන් වර්ෂයකට පැය 12 ක අවම පුහුණුවක් නියම කර නොතිබුණි. | 2020 වර්ෂය පුරාවටම පැවති කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් කඩින් කඩ ආයතනය වසා දැමීම, එම තත්වයන් හේතුවෙන් දේශකයන් ගෙන්වා ගැනීමේදී සිදුවූ අවහිරතා සහ පුහුණු ආයතන තාවකාලිකව පුහුණු වැඩසටහන් නැවැත්වීම යන කරුණු මත සැලසුම් කර තිබුණු පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කළ නොහැකි විය. |
| 03 | සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුලත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි. | දැනට 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව මෙම අමාත්‍යාංශයේ සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම ගිවිසුම් ගත ලෙස කාර්ය සාධන ගිවිසුම් සකස් කර එක් එක් නිලධාරියා වෙත නිශ්චිත වගකීම් පවරා ඇත. |
| 04 | සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි. | 2020 වර්ෂය පුරාවටම පැවති කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් කඩින් කඩ ආයතනය වසා දැමීම, එම තත්වයන් හේතුවෙන් දේශකයන් ගෙන්වා ගැනීමේදී සිදුවූ අවහිරතා සහ පුහුණු ආයතන තාවකාලිකව පුහුණු වැඩසටහන් නැවැත්වීම යන කරුණු මත සැලසුම් කළ පුහුණු වැඩසටහන් පැවැත්වීමට නොහැකි විය. එම තත්වය සමනය වීමත් සමඟ නැවතත් පුහුණු සැසි පැවැත්වීමට අවශ්‍ය පියවර ගෙන ඇත. |

ආචාර්ය බන්දුල ගුණවර්ධන
ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍ය

ආචාර්ය බන්දුල ගුණවර්ධන
ප්‍රවාහන, මහාමාර්ග හා ජනමාධ්‍ය අමාත්‍ය

ඇමුණුම (01)

මහාමාර්ග අමාත්‍යාංශය
நெடுஞ்சாலைகள் அமைச்சு
**MINISTRY OF HIGHWAYS**

මගේ අංකය / எனது இல / My no } MHE&H/ACC/14/03/04

ඔබේ අංකය / உமது இல / Your no }

දිනය / திகதி / Date } 2020.12. 11

අධ්‍යක්ෂ ජනරාල්,
රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව.
මහා භාණ්ඩාගාරය,
කොළඹ 01.

**<u>රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුමේ අය නොවන ශේෂ කපා හැරීම</u>**

**<u>ඩී.පී.දහනායක මහතා නොපියවූ අත්තිකාරම් "බී" ගිණුම් ශේෂය - රු.157,675.00</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබගේ PF/FS/W.O/21/10/158 අංක හා 2013.07.16 දිනැති ලිපිය හා බැඳේ. (පිටපතක් අමුණා ඇත.)

මෙම නිලධාරියා 1995 ජුනි මස සිට සෞඛ්‍ය මහාමාර්ග සමාජසේවා අමාත්‍යාංශයෙන් ප්‍රවාහන වාරිමාර්ග හා වනිතා කටයුතු අමාත්‍යාංශයට ස්ථාන මාරු වී ගොස් ඇති අතර 1996 අගෝස්තු මාසයේ දී ප්‍රවාහන, පාරිසරික හා වනිතා කටයුතු අමාත්‍යාශයෙන් පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය වෙත ස්ථාන මාරු වී ගොස් 2007 මාර්තු මාසයේදී විශ්‍රාම ලබා ඇත.

පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (මුදල්) ගේ FA15/2009/TR අංක හා 2009.10.20 දිනැති ලිපිය අනුව 1996.08.01 වන දින සිට එම නිලධාරියා ස්ථිර වශයෙන් එම අමාත්‍යාංශයට මුදා හරින තෙක් කාලයට අදාල සියලුම ණය වාරික ප්‍රවාහන පාරිසරික හා වනිතා කටයුතු අමාත්‍යාංශයට මාසිකව චෙක්පත් මඟින් ප්‍රේෂණය කර ඇති අතර 1998.08.01 දිනට පැවති අත්තිකාරම් "බී" ශේෂයට අදාල රු.507,880.00 ක මුදලක් චෙක්පතක් මඟින් නිරවුල් කර ඇත. (ලිපියේ පිටපතක් අමුණා ඇත.) එසේම ඔහු විශ්‍රාම ගන්නා දිනට ඔහුගේ නමින් පැවති සියලුම ණය මුදල් පියවා ඇති බව ද දන්වා ඇත.

ඒ අනුව රජය විසින් ලබා දී ඇති සියලුම ණය අය වී ඇති බව නිරීක්ෂණය වන අතර එවකට මහාමාර්ග අමාත්‍යාංශයේ ගිණුම් පොත් නිසි පරිදි යාවත්කාලීන නොවීම මත සිදු වූ ගිණුම්මය දෝෂයක් හේතුවෙන් තව දුරටත් මෙම රු.157,675.00 ක ණය ශේෂය මහාමාර්ග අමාත්‍යාංශයේ පොත්වල පමණක් අය වීමට ඇති ශේෂයක් ලෙස පෙන්වන බව නිරීක්ෂණය වේ. තවද, මෙම මුදල වසර 25 කට වඩා පැරණි ණය ශේෂයක් වන බැවින් අදාල අයකර ගැනීම් සඳහා යොදන ලද ගිණුම් සටහන් වල නිවැරදිතාවය පරීක්ෂා කිරීමට අපහසු වී ඇත. මෙම තත්වය මත ඉහත ණය ශේෂය ගිණුම් අතර මාරු පත්‍ර මඟින් නිවැරදි කිරීමේ හැකියාවක් නොමැති බව කාරුණිකව දන්වමි.

ඒ අනුව මෙම ණය ශේෂය පොත්වලින් කපා හැරීමට අවස්ථාව ලබා දෙන ලෙස කාරුණිකව ඉල්ලා සිටින අතර රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ PF/FS/Write off 21/10/158 හා 2010.10.04 දිනැති ලිපිය පරිදි ණය ශේෂය කපා හැරීමට අදාල මූ.රෙ.109 අයදුම් පත්‍රය ද පිටපත් 03 කින් යුතුව මේ සමඟ ඉදිරිපත් කරන බව කාරුණිකව දැනුම් දෙමි.

12/11

ජේ.කේ.නිලුපුල් එස්.පෙරේරා,

(F. S. T. & E.)12/78

ඇමුණුම (02)

# මු. රෙ. 109 යටතේ අලාභයන් පොතෙන් කපාහැරීම සඳහා ඉල්ලුම් පත්‍රය

## நி. பி. 109 இன்படி இழப்புக்களைப் பதிவழித்தலுக்கான விண்ணப்பம்

## APPLICATION FOR WRITE OFF OF LOSSES IN TERMS OF F. R. 109

යොමු අංක / தொடர் இல. / Ref. No. ..............................

| | | | |
|---|---|---|---|
| 1. දෙපාර්තමේන්තුව / திணைக்களம் / Department | මහාමාර්ග අමාත්‍යාංශය | | |
| 2. වාර්තාව / அறிக்கை / Report | යොමු අංකය / தொடர் இல. / Reference No. | දිනය / தேதி / Date | |
| ප්‍රාරම්භක / தொடக்க / Preliminary | | | |
| අවසාන / இறுதி / Final | PF/FS/Write off/21/10/158 | 2010 | 10 |
| | PF/FS/W.O/21/10/158 | 2013 | 07 |

3. දේපල පිළිබඳ විස්තර/பொருட்களின் விபரம்/Particulars of Propert –

| දේපළ පිළිබඳ විස්තරය/பொருட்களின் விவரணம்/De cription of Property | ප්‍රමාණය/தொகை/Quantity |
|---|---|
| බී. පී. දිසානායක මහතාගේ ණය ශේෂය | රු. 157,675/= |
| 4. මුල් පිරිවැය / மூலப் பெறுமதி / Original Cost | රු 650,815/- |
| අලාභය සිදුවූ අවස්ථාවේ දළ හෝ තක්සේරු පිරිවැය / இழப்பு நேர்ந்தபோது அதன் அண்ணளவான அல்லது மதிப்பிட்ட பெறுமதி / Approximate or Estimated cost at time of loss | රු. 157,675/= |
| ප්‍රතිසම්පාදන අගය හෝ අළුත්වැඩියා කිරීමේ වියදම / பதிலிடும் செலவு அல்லது திருத்தச் செலவு / Replacement value or cost of repairs. | — |
| මු. රෙ. 105(1) යටතේ වටිනාකම / நி. பி. 105 (1) இன்படி பெறுமதி / Value in terms of F. R. 105 (1) | රු. 157,675/= |
| වගකිවයුතු නිලධාරීන්ගෙන්/රක්ෂණයෙන්/ඇප සහතිකයෙන් අයකර ගන්නා ලද මුදල / இதற்குப் பொறுப்பான உத்தியோகத்தர்களிடமிருந்து/காப்புறுதியிலிருந்து/ உத்தரவாதத்திலிருந்து அறவிடப்பட்ட தொகை / Amount recovered from [illegible] | — |

5. නීතිමය ක්‍රියාවන්ගේ ප්‍රතිඵල/சட்ட நடவடிக்கையின் விளைவு/Outcome of legal action–

| උසාවියේ නම<br>நீதிமன்றத்தின் பெயர்<br>Name of Court | නඩු අංකය<br>வழக்கு இல.<br>Case No. | උසාවියේ නියෝගය/நீதிமன்றக் கட்டளை/Order of Court |
|---|---|---|
| | | |

6. නියම කරන ලද අධිභාරයේ විස්තර-<br>விதிக்கப்பட்ட மேலதிகக் கட்டணங்களின் விவரங்கள்–<br>Details of surcharges imposed-

| නිලධාරියාගේ නම<br>உத்தியோகத்தரின் பெயர்<br>Name of officer | පදවිය<br>பதவிப்பெயர்<br>Designation | නියම කරන ලද අධිභාරය<br>மேலதிகக் கட்டணத் தொகை<br>Amount surcharged<br>රු. / ரூ. / Rs. | ශ. / ச. / c. | අයකරගන්නා ලද මුදල<br>அறவிட்ட தொகை<br>Amount recovered<br>රු. / ரூ. / Rs. | ශ. / ச. / c. | අයකරගන්නා ලද දිනය<br>அறவிட்ட தேதி<br>Date of recovery | කුවිතාන්සි අංකය<br>பற்றுச் சீட்டு இல.<br>Receipt No. | බැර මුදල් පිළිබඳ විස්තර<br>வரவு விவரங்கள்<br>Credit particulars |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |

අදාළ නොවේ

ඇමුණුම [illegible] I

8 (ඇ.) නිලධාරියා සේවයේ නොමැති නම් ඔහුගේ වත්කමින් අලාභහානි අයකර ගැනීමට ගන්නා ලද ක්‍රියාමාර්ගයන් පිළිබඳ විස්තර—
(அ.) உத்தியோகத்தர் சேவையிலில்லாவிடின், உத்தியோகத்தரின் சொத்துக்களிலிருந்து அறவிடுதற்கு எடுத்துள்ள நடவடிக்கை—
(c.) Details of action taken to effect the recovery of shortages from the assets of the officer, if the officer is not in service—

බී. බී. දිසානායක මහතා මහාමාර්ග අමාත්‍යාංශයේ සිට වාණිජ හා නාවික කටයුතු අමාත්‍යාංශයට (1995) සහ ප්‍රවාහන අමාත්‍යාංශයේ සිට ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට (1996) මාරු වී ගොස් [illegible] ඇත. මහාමාර්ග අමාත්‍යාංශයේ සේවයෙන් පසු මෙම නිලධාරියා සේවය කළ [illegible] ප්‍රවාහන අමාත්‍යාංශයේ දී ඔහුගේ [illegible] රජයේ නිලධාරීන්ගේ [illegible] ණය ශේෂයන් [illegible] මහාමාර්ග අමාත්‍යාංශය [illegible] ඇත. ( [illegible] ලිපිය [illegible] ඇත.)

8 (ඈ.) ඉහත ක්‍රියාවේ ප්‍රතිඵල—
(ஆ.) மேற்கூறிய நடவடிக்கையின் விளைவு—
(d.) Results of the above action—

බී. බී. දිසානායක මහතාගේ රජයේ නිලධාරීන්ගේ [illegible] දී ඔහුගේ ණය ශේෂය [illegible] ලෙස මහාමාර්ග අමාත්‍යාංශයේ [illegible] වසා [illegible]

ජේ.කේ. තිලුපුල් එස්. පෙරේරා
ප්‍රධාන මූල්‍ය නිලධාරී
මහාමාර්ග අමාත්‍යාංශය
07 වන මහල, "මගනැගුම මහමැදුර"
අංක. 216, ඩෙනිසිල් කොබ්බෑකඩුව මාවත,
කොස්වත්ත, බත්තරමුල්ල.

Order or recommendation of Head of Department or Chairman of Corporation under F. R. 109—

*Secretary to Ministry of.................................................. { අමාත්‍යාංශයේ ලේකම්
அமைச்சின் செயலாளர்

දිනය
தேதி
Date } ..........................

..........................
දෙපාර්තමේන්තු ප්‍රධානියා/සංස්ථාවේ සභාපති.
திணைக்களத் தலைவர்/கூட்டுத் தாபனத் தவிசாளர்.
*Head of Department/Chairman of Corporation.*

10. මු. රෙ. 108(1) යටතේ ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ නියෝගය හෝ මු. රෙ. 108(3) යටතේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාගේ නිර්දේශය/நி. பி. 108 (1) இன்கீழ் பிரதான கணக்குப்பொறுப்பு உத்தியோகத்தரின் கட்டளை அல்லது நி. பி. 108 (3) இன் கீழ் பிரதான கணக்குப் பொறுப்பு உத்தியோகத்தரின் விதப்புரை/Order of the Chief Accounting Officer under F. R. 108 (1) o recommendation of Chief Accounting Officer under F. R. 108 (3)—

* භා. ලේ.
தி. செ.
S. T. } ..........................

යොමු අංකය
தொடர் இல.
*Ref. No.* } ..........................

ආර්. ඩබ්. ආර්. පේමසිරි
ලේකම්
මහාමාර්ග අමාත්‍යාංශය
08 වන මහල, "මගනැගුම මහමැදුර"
අංක. 216, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

දිනය
தேதி
Date } ..........................

.......................... අමාත්‍යාංශයේ ලේකම්.
.......................... அமைச்சின் செயலாளர்.
*Secretary to Ministry of* ..........................

යොමු අංකය
தொடர் இல.
*Ref. No.* } ..........................

11. .......................... අමාත්‍යාංශයේ ලේකම්
.......................... அமைச்சின் செயலாளர்
Secretary to Ministry of..........................

පොතෙන් කපාහැරීම අනුමතයි/අනුමත නොකෙරේ.
பதிவழித்தல் அனுமதிக்கப்படுகின்றது/அனுமதிக்கப்படவில்லை.
Write off authorised/not approved.

දිනය
தேதி
Date } ..........................

..........................
භාණ්ඩාගාරයේ ලේකම්.
திறைசேரிச் செயலாளர்.
*Secretary to the Treasury.*

පිටපත : විගණකාධිපති.
பிரதி : கணக்காய்வு அதிபதி.
Copy to: Auditor-General.

12. පොතෙන් කපාහැරීම සටහන් කරන ලද්දේ—
பதிவழித்தல் பினவருவனவற்றில் குறிக்கப்பட்டுள்ளது—
Write off noted in—

| තොග පොත් අංකය<br>இருப்புப் புத்தகப் பக்கம்<br>Stock Book folio | බඩු වට්ටෝරු පිටුව<br>பதிவேட்டுப் புத்தகப் பக்கம்<br>Inventory Book folio | ස්ථාවර වත්කම් ලේඛනය<br>நிலையான சொத்துக்களின் பதிவேட்டுப் பக்கம்<br>Register of fixed Assets folio | ලෙජර් පිටුව<br>பேரேட்டுப் பக்கம்<br>Ledger folio |
|---|---|---|---|
| | | | |

ඇමුණුම (03) (166)

# රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව
# அரச நிதித் திணைக்களம்
# DEPARTMENT OF PUBLIC FINANCE

අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் / Director General — Tel. 94-11-2484614, Fax. 94-11-2431458, Email: dgpf@pfd.treasury.gov.lk

කාර්යාලය / அலுவலகம் / Office — Tel. 94-11-2484637, Fax. 94-11-2431458

பொதுத் திறைசேரி
நிதி அமைச்சு
செயலகம், கொழும்பு 01, இலங்கை.

මහා භාණ්ඩාගාරය
මුදල් අමාත්‍යාංශය
මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.

General Treasury
Ministry of Finance
The Secretariat, Colombo-01, Sri Lanka.

Website: www.treasury.gov.lk
Gen. E-mail: info@pfd.treasury.gov.lk

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No | PFD/RED/WO/2021/12 | |
| ඔබේ අංකය / உமது இல / Your No | MHE&H/ACC/14/03/04 | |
| දිනය / திகதி / Date | 2021.04. 29 | |

ලේකම්
මහා මාර්ග අමාත්‍යාංශය

**<u>රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුමට අයවිය යුතු ණය ශේෂ කපා හැරීම</u>**
**<u>ඩී.පී. දහනායක මයා - රු. 157,675.00</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබේ සමාංක හා 2020.10.22 දිනැති ලිපිය හා බැඳේ.

02. යොමුගත ලිපිය මඟින් ඔබ අමාත්‍යාංශයේ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුමට අදාළව නොපියවන ලද ණය ශේෂයක් ලෙස වසර 25 කට අධික කාලයක් දැක්වෙන ඩී.පී. දහනායක මහතාගෙන් අයවිය යුතු ලෙස ඇති රු. 157,675.00 ක ණය ශේෂය, පවතින ලේඛණ අනුව සම්පූර්ණයෙන්ම අයවී ඇති බවත්, එය ගිණුම්ගත වීමේ දෝෂයක් පවතින බවත් දෝෂය මාරුපත්‍ර මඟින් නිවැරදි කිරීමේ නොහැකියාව මත පොත් වලින් කපා හැරීම සඳහා ඔබගේ නිර්දේශ සහිතව මෙම දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.

03. මෙම කරුණ සම්බන්ධයෙන් පහත කරුණු කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

(i) ඔබගේ ලිපියේ සඳහන් කපා හැරීමට ඉල්ලුම් කරන ලද ණය ශේෂය පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය විසින් ප්‍රේෂණය කර ඇති ණය ශේෂයට සමාන බවක් තහවුරු කර ගැනීමට ඇති හැකියාව පිළිබඳව සලකා ඇති බවක් ඉදිරිපත් කර ඇති ලේඛන අනුව තහවුරු නොවන බව නිරීක්ෂණය වේ.

(ii) ඔබගේ ලිපියට ඇමුණුම් ලෙස ඇති ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ වැඩබලන මහ ලේකම් විසින් ලේකම්, මහාමාර්ග අමාත්‍යාංශය අමතන ලද අංක FA15/2009/TR හා 2009.10.20 දිනැති ලිපියේ සඳහන් පරිදි යොමුගත ණය ශේෂය නිරවුල් කිරීම සඳහා ලේකම් ප්‍රවාහන හා මහා මාර්ග අමාත්‍යාංශය වෙත ලියා ඇති අංක 670380 හා 1998.08.25 දිනැති රු.507,880.00 ක් වටිනා චෙක්පත ඔබ කාර්යාලයේ GAM-83 මුදල් ඇනවුම් හා චෙක්පත් ලැබීම් ලේඛණය මඟින් ඔබ අමාත්‍යාංශයට ලැබී ඇති බව තහවුරු කර ගැනීමේ ඇති හැකියාවත්, එම චෙක්පත අමාත්‍යාංශයේ බැංකු සැසඳුම් අනුව නිශ්කාෂණය වී ඇතිද, යන්න පරීක්ෂා කරන ලද්දේ නම්, මෙම කරුණ මේ වනවිට නිරවුල් කරගත හැකි තත්ත්වයක පැවතිය යුතු බව නිරීක්ෂණය වේ.

04. මු.රෙ. 427 අනුව ඔබ අමාත්‍යාංශයට අයත් ගිණුම් පොත්පත් භාණ්ඩාගාර පොත්පත් සමඟ නොසැසඳීම නිසාත්, පවතින අභ්‍යන්තර පාලන පිළිවෙත් නිසි පරිදි ක්‍රියාත්මක නොකිරීම නිසාත් මෙම ගිණුම්මය දෝෂය සිදුව ඇති බව වැඩිදුරටත් නිරීක්ෂණය කරන අතර, එසේ පවතින විධිවිධාන අනුගමනය නොකිරීම නිසා ඇතිවන දෝෂ කපා හැරීම සඳහා කටයුතු කිරීමට විධිවිධාන නොමැති බැවින් අදාළ කරුණ පිළිබඳව තවදුරටත් පරීක්ෂා කර එකී ගිණුම්කරණ දෝෂය නිවැරදි කර ගැනීම සුදුසු බව කාරුණිකව දන්වමි.

ජේ.සී. [illegible]

ඇමුණුම (04) (166) i

BoC 679 @ 20C 1

MHE&H/ACC/14/03/04

2021.08. 04

කළමනාකරු,

ලංකා බැංකුව,

බත්තරමුල්ල.

<u>අංක 670380 චෙක්පතෙහි නිෂ්කාශන තොරතුරු ලබා ගැනිම</u>

මහාමාර්ග අමාත්‍යාංශය පෙර ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය ලෙසින් පැවති 1998 වර්ෂයේ ඩී.පී දහනායක නමැති නිලධාරියෙකුගේ ණය මුදලක් පියවීම සඳහා වූ රු. 507,880.00 ක චෙක්පතක් ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය වෙත ලැබී ඇත. මෙම චෙක්පත මහාමාර්ග අමාත්‍යාංශයීය පොත්වල ගිණුම්ගත වී නැත. චෙක්පත හා සබැඳි තොරතුරු පහත පරිදි වේ.

- චෙක්පත් අංකය - 670380
- චෙක්පත් දිනය - 1998.08.25
- ගිණුමේ නම - ලේකම්, ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය
- ගිණුම් අංකය - 2937490
- මුදල - රු.507,880.00

02. මෙම චෙක්පත නිවැරදිව ප්‍රවාහන හා මහමාර්ග අමාත්‍යාංශයේ ගිණුමට බැර වූයේ ද එසේ නම් අමාත්‍යාංශයීය පොත්වල ගිණුම්ගත නොවූයේ මන්ද යන කරුණු පිළිබඳව තොරතුරු සොයා ගැනීමට අවශ්‍ය වී ඇත.

03. ඒ අනුව මෙම කරුණු සහ අපගේ අවශ්‍යතාවය පිළිබඳ ඔබගේ කාරුණික අවධානය යොමු කොට මෙම චෙක්පත ලංකා බැංකුවේ ඉහත සඳහන් ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයීය 2937490 අංක නිල බැංකු ගිණුමට නිෂ්කාශනය වී තිබේ ද යන්න පිළිබඳව තොරතුරු අප වෙත ලබා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

✓

ටී.ඒ.ඩී.සී.එන්.වීරක්කොඩි,

ප්‍රධාන ගණකාධිකාරී,

මහාමාර්ග අමාත්‍යාංශ ලේකම් වෙනුවට.

ඇමුණුම (05) (112)

BANK OF CEYLON

BOC

ලංකා බැංකුව இலங்கை வங்கி

අධිශ්‍රේණි ශාඛාව බත්තරමුල්ල
විද්‍යුත් තැපෑල : boc679@boc.lk

දුරකථන අංක : 0112 862 575/6
ෆැක්ස් අංකය : 0112 862 770

---

දිනය : 2021/11/30

යොමුව : පසුපෙළ කාර්යාලය

ප්‍රධාන ගණකාධිකාරී / ගණකාධිකාරී
මහාමාර්ග අමාත්‍යාංශය
සෙත්සිරිපාය
බත්තරමුල්ල

මහත්මයාණෙනි / මහත්මියනි

**චෙක්පත් අංක 670380 හි නිෂ්කාශනය හා සබැඳේ**

ඔබ විසින් 2021/08/04 දින අප ශාඛාව වෙත එවනු ලැබූ ලිපියට අදාලව ඉහත සඳහන් 1998/08/25 දාතම රු. 507,880/- ක් වූ අංක 670380 චෙක්පත ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයීය 2937490 අංක ගිණුමට නිෂ්කාශනය වී තිබේද යන්න පිළිබඳ තහවුරුවක් ලබා දීමට ප්‍රමාණවත් තොරතුරු අප සතුව නොමැති බව මෙයින් කරුණිකව දන්වා සිටිමු.

මෙයට
විශ්වාසී

BANK OF CEYLON ... Battaramulla - 679

වැ.බ. ප්‍රධාන කළමණාකාරිණි

ඇමුණුම (06)

HWY/ACC/14/03/04

2021.12.14

ප්‍රධාන ලේකම්,

මධ්‍යම පළාත් සභාව

**එල්.ඩබ්.විමලවීර මයාගේ ණය ශේෂය නිරවුල් කිරීම සඳහා**

ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ගේ අංක 1/1/3300(ජී) සහ 1989.07.25 දිනැති ලිපිය අනුව එල්.ඩබ්.විමලවීර (ලිපිකරු සේවය) නමැති නිළධාරියා 1989.07.26 දින ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ සිට මධ්‍යම පළාත් සභාව වෙත ස්ථාන මාරු වී ගොස් ඇත. එම ස්ථාන මාරු ලිපියේ පිටපතක් මේ සමඟ ඔබ වෙත ඉදිරිපත් කරමි.

01. නිළධාරියා ස්ථාන මාරු වී යන අවස්ථාවේ ඔහුගේ ආපදා ණය ශේෂය රු.72,392.00 ලෙස පැවත ඇති අතර එය මේ වන තෙක් මහාමාර්ග අමාත්‍යාංශය වෙත නිරවුල් කර නොමැත. අවස්ථා කීපයකදී ම මේ පිළිබඳව දැනුම් දී ඇතත් ඒ සඳහා ප්‍රතිචාර කිසිවක් ලැබී නැත.

02. සැලකිය යුතු කලක සිට නිරවුල් නොවූ ණය ශේෂ පිළිබඳව ගිණුම් කාරක සභාව වෙතින් දැඩි දෝෂ දර්ශනයට ලක් වී ඇති අතර කඩිනමින් ණය ශේෂ නිරවුල් කරන ලෙස නියෝග ලබා දී ඇත.

03. ඉහත කරුණු පිළිබඳ ඔබගේ කාරුණික අවධානය යොමු කර උක්ත ණය ශේෂය කඩිනමින් නිරවුල් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

04. මේ පිළිබඳව ඔබගේ සක්‍රීය දායකත්වය ඉතා අගය කරමි.

ජේ.කේ.නිලුපුල් එස්.පෙරේරා

ප්‍රධාන මූල්‍ය නිළධාරී

අත්/කලේ -

ආර්.ඩබ්.ආර්.පේමසිරි

ලේකම්,

මහාමාර්ග අමාත්‍යාංශය.

පිටපත - 01. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව - දැ.ගැ.ස.

02. නියෝජ්‍ය ලේකම් (මුදල්) , මධ්‍යම පළාත් සභාව - අ.ක.ස.

ප්‍රධාන ලේකම්
பிரதானசெயலாளர்
Chief Secretary
T:P - 0812223418,
Fax - 0812223418

කාර්යාලය
அலுவலகம்
Office
T:P - 0814953289/90,
Fax - 0812239075

විද්‍යුත් තැපෑල
மின் அஞ்சல்
E-mail
csecp1@gmail.com

වෙබ් අඩවිය
இணையத்தளம்
Web site
www.cs.cp.gov.lk

# ප්‍රධාන ලේකම් කාර්යාලය - මධ්‍යම පළාත
# பிரதானசெயலாளர் அலுவலகம்- மத்தியமாகாணம்
# Chief Secretary's Office - Central Province

තැ.පෙ. 102, ප්‍රධාන ලේකම් කාර්යාලය,
මධ්‍යම පළාත් සභා සංකීර්ණය,
පල්ලේකැලේ, කුණ්ඩසාලේ

த.பெ.102,பிரதானசெயலாளர் அலுவலகம்,
மத்தியமாகாண சபை கட்டிடத்தொகுதி,
பல்லேகலை,குண்டசாலை

P.O Box 102, Chief Secretary's Office,
Central Provincial Council Complex,
Pallekele, Kundasale

මගේ අංකය / எனது இல / My No: CPC/CS/8/6/15/09

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date: 2022-02.17

ලේකම්,
මාර්ග අමාත්‍යාංශය,
මහනැගුම,
මහමැදුර,
8 වන මහළ,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

<u>එල්. ඩබ්. විමරලවීර මහතාගේ ණය ශේෂ නිරවුල් කිරීම සඳහා</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබගේ සමාංක හා 2021-12-14 දිනැති ලිපිය හා බැඳේ.

2. එම ලිපියෙන් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂගේ අංක 1/1/3300(ජී) හා 1989-07-25 දිනැති ලිපිය අනුව එල්. ඩබ්. විමලවීර (ලිපිකරු) නැමති නිලධාරියා 1989-07-26 දින ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ සිට මධ්‍යම පළාත් සභාවට ස්ථාන මාරු වී පැමිණි බවත්, ඔහුගේ ණය ශේෂය රු. 72,392.00 බවත් එය මෙතෙක් පියවා නොමැති බවත් දන්වා ඇත.

3. 2021-12-31 දිනට මධ්‍යම පළාත් භාණ්ඩාගාරයේ උක්ත නමින් මධ්‍යම රජයට ගෙවිය යුතු ශේෂයක් පෙන්නුම් නොකරන බව කාරුණිකව සඳහන් කරමි.

4. මෙම නිලධාරියා මධ්‍යම පළාත් සභාවට ස්ථාන මාරු වී පැමිණි අමාත්‍යාංශය හෝ දෙපාර්තමේන්තුව සඳහන් කර එවන්නේනම් මේ පිළිබඳ මැදිහත්වී ඉදිරි කටයුතු සිදු කළ හැකි බව වැඩි දුරටත් සඳහන් කරමි.

ජේ . පී. එච්. මහානාම,
අධ්‍යක්ෂ (ගිණුම් හා ගෙවීම්),
ප්‍රධාන ලේකම් වෙනුවට,
මධ්‍යම පළාත.

<u>පිටපත</u>

1. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව - කා. දැ. පි.

ඇමුණුම (08)

MHE&H/ACC/14/03/04 2022.03.08

ප්‍රධාන ලේකම්,

මධ්‍යම පළාත,

**<u>එල්.ඩබ්.විමලවීර මහතාගේ ණය ශේෂය නිරවුල් කිරීම සඳහා</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබගේ අංක CPC/CS/8/6/15/09 හා 2022.02.17 දිනැති ලිපිය හා බැඳේ.

02. මහාමාර්ග අමාත්‍යාංශය එවකට ප්‍රවාහන හා මහාමාර්ග රාජ්‍ය අමාත්‍යාංශය ලෙස පැවති කාලයේ මෙම එල්.ඩබ්.විමලවීර මහතාගේ ස්ථාන මාරුව සිදු වී ඇත. ඒ අනුව ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයෙන් 1989.08.01 වන දින මධ්‍යම පළාත් සභාව වෙත මෙම අනුයුක්ත කිරීම සිදු කර තිබේ. එම ස්ථාන මාරු කිරීම සිදු කල ලිපියේ පිටපතක් ඔබගේ දැනුවත් වීම උදෙසා මේ සමඟ අමුණා එවමි.

03. මධ්‍යම පළාත් සභාව වෙතින් මෙම නිලධාරියා කුමන අමාත්‍යාංශයකට ස්ථාන මාරු කර තිබේ ද යන්න පිළිබඳව තොරතුරු කිසිවක් මහාමාර්ග අමාත්‍යාංශය සතුව නොමැත.

04. මෙම කරුණ පිළිබඳව පෙර එවූ ලිපිය පිළිබඳව ඔබගේ ප්‍රතිචාරය ඉතා අගය කොට සලකන අතර මෙම ණය ශේෂය නිරවුල් කර ගැනීම සඳහා ඉදිරියටත් ඔබගේ කාරුණික සහයෝගය අපේක්ෂා කරමි.

ටී.ඒ.ඩී.සී.එන්.වීරක්කොඩි,

ප්‍රධාන ගණකාධිකාරී,

මහමාර්ග අමාත්‍යාංශ ලේකම් වෙනුවට.

ඇමුණුම (09)

HWY/ACC/14/03/04

2022.02.01

කළමනාකරු,

ජාතික රක්ෂණ භාර අරමුදල,

චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,

කොළඹ 02.

**<u>රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුමේ දීර්ඝකාලීනව නිරවුල් නොවී පවතින ණය ශේෂ නිරවුල් කිරීමට තොරතුරු ලබා ගැනීම සඳහා</u>**

මහාමාර්ග අමාත්‍යාංශයේ සේවය කර 1988-1995 කාල වකවානුවේ දී ස්ථාන මාරු ලැබ ගොස් ඇති පහත නම් සඳහන් නිලධාරීන්ගෙන් රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුමට ණය ශේෂ අය වීමට ඇති අතර ඒවා නිරවුල් කිරීම සඳහා විවිධ මාර්ගයන්ගෙන් තොරතුරු ලබා ගැනීමට උත්සාහ කල ද මේ දක්වා සාර්ථක ප්‍රතිඵල ලැබී නැත.

- එල්.ඩබ්.විමලවීර මයා - ලිපිකරු
- ජී.ආර්.කරුණාරත්න මයා - කාර්යාල කාර්ය සහායක
- පී.එම්.චන්ද්‍රසිරි මයා - ලිපිකරු

02. ගැලපිය යුතු කලක සිට දිගින් දිගටම අත්තිකාරම් බී ගිණුමේ නිරවුල් නොවූ ණය ශේෂයන් ලෙස ඉදිරියට ගෙන එනු ලබන මෙම ණය ශේෂයන් පිළිබඳව රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ද නිරන්තර විමසීම් කර ඇත. ඉහත කාල වකවානුව තුල හෝ ඉන් පසු කාල සීමාවන් තුල දී මෙම නිලධාරීන් තිදෙනා වෙතින් ජාතික රක්ෂණ භාර අරමුදල වෙත සිදු කර ගත් මාසික අඩකාරණ, ඔවුන් වෙත ලබා දුන් ප්‍රතිලාභ ගෙවීම, ජාතික හැඳුනුම්පත් අංක හෝ හෝ සේවය කළ සේවා ස්ථාන වැනි කිසියම් තොරතුරක් වේ නම් එම තොරතුරු ලබා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

03. මෙම නිලධාරීන්ගේ පෞද්ගලික ලිපි ගොනු ද අමාත්‍යාංශය සතුව නොමැති බැවින් ඔබ වෙත ලබා දිය හැකි තොරතුරුවන්නේ නිලධාරීන්ගේ නම් හා තනතුරු පමණි. ඔබගේ දත්ත පද්ධතිය තුල මෙම නිලධාරීන්ගේ තොරතුරුවලට සමාන තොරතුරු කිහිපයක් හෝ ඇත්නම් ඒ සියල්ල ලබා දෙන මෙන් වැඩි දුරටත් ඉල්ලා සිටින අතර සියලු තොරතුරු පරීක්ෂා කර අදාල නිලධාරියා හඳුනා ගැනීමට එය ප්‍රයෝජනවත් වනු ඇත.

04. ඔබ විසින් මේ සම්බන්ධයෙන් තොරතුරු ලබා දීමට දක්වන සහයෝගය ඉතා අගය කොට සලකමි.

ජේ.කේ.තිලුපුල් එස්.පෙරේරා,

ප්‍රධාන මූල්‍ය නිලධාරී,

මහාමාර්ග අමාත්‍යාංශ ලේකම් වෙනුවට.

ඇමුණුම 19

HWY/ACC/14/03/04

2022.03.21

ලේකම්,

රාජ්‍ය සේවා ,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය,

නිදහස් මාවත,

කොළඹ 07.

<u>රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුමේ දීර්ඝකාලීනව නිරවුල් නොවී</u>

<u>පවතින ණය ශේෂ නිරවුල් කිරීමට තොරතුරු ලබා ගැනීම සඳහා</u>

මහාමාර්ග අමාත්‍යාංශයේ සේවය කර 1988-1995 කාල වකවානුවේ දී ස්ථාන මාරු ලැබ ගොස් ඇති පහත නම් සඳහන් නිලධාරීන්ගෙන් රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුමට අය වීමට ඇති ණය ශේෂ නිරවුල් කිරීම සඳහා විවිධ මාර්ගයන්ගෙන් තොරතුරු ලබා ගැනීමට උත්සාහ කල ද මේ දක්වා සාර්ථක ප්‍රතිඵල ලැබී නැත.

- එල් ඩබ්.විමලවීර මයා (ලිපිකරු) - රු. 72,392.00
- ජී.ආර්.කරුණාරත්න මයා (කා.කා.ස.) - රු. 37,774.00
- පී.එම්.චන්ද්‍රසිරි මයා (ලිපිකරු) - රු. 24,481.00

02. වසර 30 කට වඩා පැරණි මෙම ණය ශේෂ අයත් නිළධාරීන්ගේ පෞද්ගලික ලිපි ගොනු ද මේ වන විට මහාමාර්ග අමාත්‍යාංශය සතුව නැත. එවකට මහාමාර්ග අමාත්‍යාංශය පසුකාලීනව අමාත්‍යාංශ කිහිපයක් ලෙස බෙදී වෙන්ව ගොස් ඇති නිසා මෙම නිළධාරීන් ස්ථාන මාරු වී ගොස් ඇති සේවා ස්ථානය ද සොයා ගැනීම අපහසු වී ඇත. දිගු කාලයක සිට මෙම ණය ශේෂයන් පොත්වල පවත්වා ගෙන ඒම නිසා රාජ්‍ය ගිණුම් කාරක සභාව ඉදිරියේ කරුණු දැක්වීමට පවා සිදුව ඇත.

03. එබැවින් ඉහත සඳහන් කාල වකවානුව තුල දී මහාමාර්ග අමාත්‍යාංශය වෙතින් ස්ථාන මාරු වී ගොස් ඇති මෙම නිලධාරීන් තිදෙනා ගේ ස්ථාන මාරු වූ සේවා ස්ථානයන්, ජාතික හැඳුනුම්පත් අංකයන්, පෞද්ගලික ලිපිනයන් වැනි තොරතුරුවලින් කුමක් හෝ ඔබ සතුව වේ නම් එම තොරතුරු ලබා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

04. ඔබ විසින් මේ සම්බන්ධයෙන් තොරතුරු ලබා දීමට දක්වන සහයෝගය ඉතා අගය කොට සලකමි.

ජේ.කේ.නිලුපුල් එස්.පෙරේරා,

ප්‍රධාන මූල්‍ය නිළධාරී,

මහාමාර්ග අමාත්‍යාංශ ලේකම් වෙනුවට.

ඇමුණුම 11 | 19

HWY/ACC/14/03/04

2022.01. 19

විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්,

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව,

මාලිගාවත්ත.

**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුමේ දීර්ඝකාලීනව නිරවුල් නොවී පවතින ණය ශේෂ නිරවුල් කිරීමට තොරතුරු ලබා ගැනීම සඳහා**

මහාමාර්ග අමාත්‍යාංශයේ සේවය කර 1988-1995 කාල වකවානුවේ දී ස්ථාන මාරු ලැබ ගොස් ඇති පහත නම් සඳහන් නිලධාරීන්ගෙන් රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුමට ණය ශේෂ අය වීමට ඇති අතර ඒවා නිරවුල් කිරීම සඳහා විවිධ මාර්ගයන්ගෙන් තොරතුරු ලබා ගැනීමට උත්සාහ කල ද මේ දක්වා සාර්ථක ප්‍රතිඵල ලැබී නැත.

- එල්.ඩබ්.විමලවීර මයා (ලිපිකරු) - රු. 72,392.00
- ජී.ආර්.කරුණාරත්න මයා (කා.කා.ස.) - රු. 37,774.00
- පී.එම්.චන්ද්‍රසිරි මයා (ලිපිකරු) - රු. 24,481.00

02. සැලකිය යුතු කලක සිට දිගින් දිගටම අත්තිකාරම් බී ගිණුමේ නිරවුල් නොවූ ණය ශේෂයන් ලෙස ඉදිරියට ගෙන එනු ලබන මෙම ණය ශේෂයන් පිළිබඳව රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ද නිරන්තර විමසීම් කර ඇත. එබැවින් මෙම නිලධාරීන් කිසිවෙකු වෙත විශ්‍රාම වැටුප් ගෙවීම සිදු කරන්නේ නම් ඒ පිළිබඳ විස්තර ලබා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

03. මෙම නිලධාරීන්ගේ පෞද්ගලික ලිපි ගොනු ද අමාත්‍යාංශය සතුව නොමැති බැවින් ඔබ වෙත ලබා දිය හැකි තොරතුරු වන්නේ නිලධාරීන්ගේ නම්, තනතුරු හා ණය ශේෂයන් පමණි. ඔබගේ දත්ත පද්ධතිය තුල මෙම නිලධාරීන්ගේ තොරතුරුවලට සමාන තොරතුරු කිහිපයක් හෝ ඇත්නම් ඒ සියල්ල ලබා දෙන මෙන් වැඩි දුරටත් ඉල්ලා සිටින අතර සියලු තොරතුරු පරීක්ෂා කර අදාල නිලධාරියා හඳුනා ගැනීමට එය ප්‍රයෝජනවත් වනු ඇත.

04. ඔබ විසින් මේ සම්බන්ධයෙන් තොරතුරු ලබා දීමට දක්වන සහයෝගය ඉතා අගය කොට සලකමි.

ජේ.කේ.නිලූපුල් එස්.පෙරේරා,

ප්‍රධාන මූල්‍ය නිලධාරී,

මහාමාර්ග අමාත්‍යාංශ ලේකම් වෙනුවට.

ඇමුණුම (12) (192)

HWY/ACC/14/03/04

2022.04.27

ප්‍රාදේශීය ලේකම්,

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,

මධ්‍යම පළාතේ සියලු ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත.

රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුමේ ණය ශේෂ නිරවුල් කර ගැනීම

මහාමාර්ග අමාත්‍යාංශයේ සේවය කර 1988-1995 කාල වකවානුව තුල දී ස්ථාන මාරු ලැබ ගොස් ඇති පහත නම් සඳහන් නිලධාරීන්ගෙන් රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුමට අය විය යුතු ණය ශේෂයන් පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| **01.එල්.ඩබ්.විමලවීර මයා** | - | **රු.72,392.00** |
| **02. ඒ ආර්.කරුණාරත්න මයා** | - | **රු.37,774.00** |
| **03. පී.එම්.චන්ද්‍රසිරි මයා** | - | **රු.24.481.00** |

02. වසර 30 කට වඩා පැරණි මෙම ණය ශේෂ හිමි නිලධාරීන් මේ වන විට විශ්‍රාම ගොස් ඇතැයි අපේක්ෂා කරමි. ස්ථාන මාරු ලැබ ගොස් ඇති ආසන්න කාල සීමාවල දී මෙම ණය ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කර නොමැති වීමත්, සහ පසු කාලීනව සිදු වී ඇති අමාත්‍යාංශ ඒකාබද්ධ වීම් හා වෙනස් වීම් හේතු කොට ගෙන මෙම නිලධාරීන්ගේ පෞද්ගලික ලිපි ගොනු සොයා ගැනීමට නොහැකි වීමත් සහ වසර 30 කට වඩා පැරණි වීමත් යන කරුණු හේතු කොට ගෙන ණය ශේෂ නිරවුල් කිරීමට නොහැකි වී ඇත.

03. මේ සඳහා දියත් කල විවිධ ක්‍රියාමාර්ග රාශියක් අවසානයේ ප්‍රතිඵලයක් නොලත් බැවින් මෙසේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙතින් තොරතුරු ලබා ගැනීමට අදහස් කළෙමි. ඔබ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ විශ්‍රාම වැටුප් ලබන නිලධාරීන් අතර ඉහත නම්වලට සමාන අයෙක් සිටී නම් ඒ බව ද නොඑසේ නම් ඒ බව ද ලිඛිතව දන්වා එවන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

03. දීර්ඝකාලීනව නිරවුල් නොවී පවතින මෙම ණය ශේෂ නිරවුල් කර ගැනීම සඳහා තොරතුරු ලබා දීමෙන් ඔබ දක්වන සහයෝගය ඉතා අගය කොට සලකමි.

ඊ.පී.පී.මහේෂිකා,

ගණකාධිකාරී (ගිණුම්),

මහාමාර්ග අමාත්‍යාංශ ලේකම් වෙනුවට.

ඇමුණුම (13)

HWY/ACC/14/03/04 2022.10.27

ප්‍රාදේශීය ලේකම්,

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,

බස්නාහිර පළාතේ සියලු ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත.

<u>රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුමේ ණය ශේෂ නිරවුල් කර ගැනීම</u>

මහාමාර්ග අමාත්‍යාංශයේ සේවය කර 1988-1995 කාල වකවානුව තුල දී ස්ථාන මාරු ලැබ ගොස් ඇති පහත නම් සඳහන් නිලධාරීන්ගෙන් රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුමට අය විය යුතු ණය ශේෂයන් පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| **01.එල්.ඩබ්.විමලවීර මයා** | - | **රු.72,392.00** |
| **02. ඒ ආර්.කරුණාරත්න මයා** | - | **රු.37,774.00** |
| **03. පී.එම්.චන්ද්‍රසිරි මයා** | - | **රු.24.481.00** |

02. වසර 30 කට වඩා පැරණි මෙම ණය ශේෂ හිමි නිලධාරීන් මේ වන විට විශ්‍රාම ගොස් ඇතැයි අපේක්ෂා කරමි. ස්ථාන මාරු ලැබ ගොස් ඇති ආසන්න කාල සීමාවල දී මෙම ණය ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කර නොමැති වීමත්, සහ පසු කාලීනව සිදු වී ඇති අමාත්‍යාංශ ඒකාබද්ධ වීම් හා වෙනස් වීම් හේතු කොට ගෙන මෙම නිලධාරීන්ගේ පෞද්ගලික ලිපි ගොනු සොයා ගැනීමට නොහැකි වීමත් සහ වසර 30 කට වඩා පැරණි වීමත් යන කරුණු හේතු කොට ගෙන ණය ශේෂ නිරවුල් කිරීමට නොහැකි වී ඇත.

03. මේ සඳහා දියත් කල විවිධ ක්‍රියාමාර්ග රාශියක් අවසානයේ ප්‍රතිඵලයක් නොලත් බැවින් මෙසේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙතින් තොරතුරු ලබා ගැනීමට අදහස් කළෙමි. ඔබ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ විශ්‍රාම වැටුප් ලබන නිලධාරීන් අතර ඉහත නම්වලට සමාන අයෙක් සිටී නම් ඒ බව ද නොඑසේ නම් ඒ බව ද ලිඛිතව දන්වා එවන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

03. දීර්ඝකාලීනව නිරවුල් නොවී පවතින මෙම ණය ශේෂ නිරවුල් කර ගැනීම සඳහා තොරතුරු ලබා දීමෙන් ඔබ දක්වන සහයෝගය ඉතා අගය කොට සලකමි.

ඊ.පී.පී.මහේෂිකා,

ගණකාධිකාරී (ගිණුම්),

මහාමාර්ග අමාත්‍යාංශ ලේකම් වෙනුවට.